# කොළඹ පාරිභෝගික මිල දර්ශකය

## අගෝස්තු මස දළ විශ්ලේෂණය


2024 අගෝස්තු 30

පදනම 2021 = 100


**191.1**

අද දින ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2024 අගෝස්තු මාසය සඳහා 2021=100 දර්ශක යොමු කාලයට ගණනය කළ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො..පා.මි.ද.) සහ කොළඹ නාගරික ප්‍රදේශය සඳහා මාසික පාරිභෝගික උද්ධමනය ප්‍රකාශයට පත් කරනු ලබයි.

### කො.පා.මි.ද., 2024 ජූලි මාසයට සාපේක්ෂව 2024 අගෝස්තු මාසයේ උද්ධමනයේ කැපී පෙනෙන වෙනස්කම්




## උද්ධමනය (කොළඹ නාගරික) 0.5%



කො.පා.මි.ද. (පදනම 2021=100): බර තැබීම් %
ආහාර: 26.2% ආහාර නොවන: 73.8%

**කො.පා.මි.ද., මතුපිට (අගෝස්තු 2024)**

ලක්ෂ්‍යමය උද්ධමනය **0.5%**

ආහාර කාණ්ඩය සඳහා ලක්ෂ්‍යමය උද්ධමනය: **0.8%**

ආහාර නොවන කාණ්ඩය සඳහා ලක්ෂ්‍යමය උද්ධමනය: **0.4%**

මාසික වෙනස: **-1.8%**

**කො.පා.මි.ද., යටිදැරි* (අගෝස්තු 2024)**


* නිතර මිල වෙනස්වන ආහාර, බලශක්ති හා ප්‍රවාහන වියදම් ඉවත් කළ පසු

ලක්ෂ්‍යමය උද්ධමනය: **3.6%** මාසික වෙනස: **-0.3%**

**ලක්ෂ්‍යමය උද්ධමනය (0.5%) සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩයන්හි දායකත්වය**

ආහාර: **0.25%** ආහාර නොවන: **0.27%**

### කො.පා.මි.දර්ශකය (පදනම:2021=100) මතුපිට, ආහාර, ආහාර නොවන සහ උද්ධමන අනුපාතයන්ගේ විචලනය




**මාසයට අදාළ විශේෂිත කරුණු**

- 2024 ජූලි මාසය සඳහා 194.7ක් වූ කො.පා.මි.ද. (මතුපිට) (පදනම:2021=100), 2024 අගෝස්තු මාසයේදී 191.1ක් දක්වා අඩු වී ඇත.
- මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩය මගින් -0.64% ක හා ආහාර නොවන කාණ්ඩය මගින් -1.21%ක දායකත්වයක් ලැබී ඇත.
- 2024 ජූලි මාසයේදී 177.9ක් වූ කො.පා.මි.ද.(යටිදැරි) (පදනම:2021=100), 2024 අගෝස්තු මාසයේදී 177.3 දක්වා අඩු වී ඇත.
- දර්ශක යොමු කාලයට (2021) සාපේක්ෂව පොදු මිල මට්ටමෙහි වැඩිවීම 91.1% කි.

2024 සැප්තැම්බර් මාසය සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2024.09.30 දින ප.ව. 3.00ට නිකුත් කරනු ලැබේ.


**මිල හා වේතන අංශය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය - ශ්‍රී ලංකාව.**


**වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.**

*http://www.statistics.gov.lk/InflationAndPrices/StaticalInformation/MonthlyCCPI*